**යටියන්තොට ප්‍රාදේශීය සභාව** **සභා වාර්තාව - 2023.01.10**

**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව** **දිනය - 2023.01.10** **වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා

2.ගරු උප සභාපති - ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10 .එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11. ඒ.ජී.තිලකරත්න මැතිතුමා
12.ඩී.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
13.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
14.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
15.ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
16.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
17.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
18.එස්.සුදර්ශන් මැතිතුමා
19.එච්.ඒ.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය
20.කේ.මධුෂිකා ප්‍රශාදිනි මැතිනිය.
21.එම්.ඩී.ඥානවති මැතිනිය
22.බී.සීතා රංජනි මැතිනිය
23.ඒ.පී.ඩබ්ලිව්.එම්.ඩයනා උදයංගනි මැතිනිය
24.කේ.කමල්රාජ් මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා

02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා

03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ටී.ඉමල්කා සංජීවනි මැතිනිය

04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රිතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වි සිටින ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රිතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා. ලැබුවා වූ 2023 නව වසර සියළුම පැතුම් ඉටුවන සුභ නව වසරක් වේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.සභාවේ සියළු කාරණාවලට මැදිහත්වෙලා සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ නොමඳ සහයෝගය ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

2022.12.27වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.12.27 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
2022.12.27 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන-**
*. පළාත් පාලන කොමසාරිස් 2022.12.29 දිනැති ලිපිය මගින් රාජ්‍ය වියදම් පාලනය කිරිම සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් ගරු මහ සභාවේ දැන ගැනිම සඳහා නිවේදනය කරමි.
*. පළාත් පාලන කොමසාරිස් වෙතින් 2023.01.04 වන දින ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය පිළිබඳ පළාත් ඒකාබද්ධ යාන්ත්‍රණයට දායක වීම පිළිබඳව දැනුවත් කිරිම සම්බන්ධයෙන් සභාවේ දැන ගැනිම සඳහා නිවේදනය කරමි.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
**(ඉ) කල් දී ඇති යෝජනාව**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
**(ඉ) 01.** යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිල ඇඳුම් දීමනාව හිමි 38ක් දෙනෙකු සඳහා නිල ඇඳුම් දීමනාව ලෙස රු.4,000.00ක් බැගින් රු.152,000.00ක වියදම සභා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.
**ගරු උප සභාපති ඒ.වි රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.
**(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 02. වීදි පහන් අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමට අදාළව 2022.11.11 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව පහත සඳහන් පරිදි සපයා ගැනීමටත්, ඒ වෙනුවෙන් ගෙවීම් කිරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

| අනු අංකය | ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකක මිල(රු) | මුළු මුදල (රු) | ආයතනයේ නම |
|---|---|---|---|---|---|
| 01 | Cobra Light Chip 50W | 80 | 825.00 | 66,000.00 | තිලක් එන්ටර්ප්‍රයිසස් |
| 02 | Cobra Light Driver 50W | 80 | 1,390.00 | 111,200.00 | |
| | | | | <u>**177,200.00**</u> | |

**ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. අළුත්වැඩියාවේ දි වඩාත් අත්‍යවශ්‍ය තැන් සොයා බලා කටයුතු කිරීමට අවධානය යොමු කරන්න.බල්බ් නිවන්න වගකීමක් තියෙන තැන පමණක් අළුත්වැඩියා කරමු.නිවන්න නැති තැන ඉවත් කරන්න කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි,භාණ්ඩ ලබා ගැනිමේ දි ගුණාත්මක ද්‍රව්‍ය සපයාගනිමු.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා**
ගරු සභාපතිතුමනි, විදුලි අර්බුදය නිසා අළුත්වැඩියා කටයුතු සිදුකරන්න නොහැකි වුණා.මල්වත්ත දුනුකේදෙණිය මාර්ගයේ අළුත්වැඩියා වලට අවධානය යොමු කරන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත (ඉ) 02 යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 02 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.
**(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 03. 2023 වර්ෂයට සැපයුම් හා සේවාවන් සඳහා මෙම සභාවට මුදල් ගෙවා ලියාපදිංචි කර ගන්නා ලෙස ආයතන වලින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එම ආයතන 2023 වර්ෂයට අදාළව යටියන්තොට ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සුදර්ශන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.වසරේ කුමන හෝ දිනයක ලැබෙනවා නම් ලියා පදිංචියට අවස්ථාව ලබා දෙන්න කියා මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි,සුදර්ශන් මැතිතුමාගේ අදහස හොඳයි.අපි ඒකට එකඟයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව වසරේ ඕනෑම දිනක ලැබෙන ඉල්ලීමක් ලියාපදිංචි කර ගැනීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 03 යෝජනාව වසරේ ඕනෑම දිනක ලැබෙන ඉල්ලීමක් ලියාපදිංචි කර ගැනීමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 04. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ වෙබ් සේවාව සැපයීම වෙනුවෙන් 2023.01.01 සිට 2023.12.31 දක්වා වූ කාලය සඳහා රු.14,490.00 ක සේවා ගාස්තුවක් (Web Hosting Charge) ප්‍රොකෝන්ස් ඉන්ෆෝටෙක් ආයතනය වෙත ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 05. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා අවශ්‍ය ඉන්ධන සීමාසහිත යටියන්තොට (විවිධ) සේවා සමුපකාර සමිතියෙන් ලබා ගනු ලැබේ. එම ඉන්ධනවලට අදාළ බිල්පත මාසිකව ගෙවීම් කළ යුතුව ඇත. මාසිකව රු.700,000.00 ක උපරිම සීමාවකට යටත්ව 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඉන්ධන ලබා ගැනීම සඳහා සීමාසහිත යටියන්තොට (විවිධ) සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම් කිරීම වෙනුවෙන් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 06. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ජල බවුසර් කුලියට ලබා දීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවහන මණ්ඩලය මගින් ජලය ලබා ගැනීම වෙනුවෙන් රු.31,608.50ක බිල්පත සහා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 07. අප සභාවේ සේවා ගිවිසුම් මත සේවයේ නියුතු පහත සඳහන් මහත්ම මහත්මීන් විසින් ආපදා ණය මුදලක් ඉල්ලුම් කර ඇත. එම මුදල සහා අරමුදලින් ගෙවීම් කිරිම සඳහා මා යෝජනා කරනවා.
1.පී.වී.ඉන්දික ප්‍රසාද් මහතා - රු.100,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පි ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 08. පනාවත්ත වතු රෝහල හා හල්ගොල්ල වතු රෝහල පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනිමට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් මෙම ආයතනයේ එකඟතාවය විමසා ඇත.ඒ සඳහා මහ සභාවේ ආවරන අනුමැතියට යටත්ව ලබා දුන් එකඟතාවය ස්ථිර කර ගැනිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිම සුදුසු බව මා යෝජනා කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කිරිපෝරුව,හල්ගොල්ල,පනාවත්ත රෝහල දැනට කලකට පෙර පවරා ගත්තත් ඒවා ක්‍රියාත්මක වුනේ නෑ. එම නිසා එම වතු රෝහල් ක්‍රියාත්මක තත්වයේ තබා ගන්නා ලෙස පළාත් සෞඛ්‍ය අංශවලට දන්වන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත(ඉ) 08 යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 08 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 09. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය මගින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ශිල්පිය පාඨශාලාව හඳාරා කාර්යස්ථ පුහුණුවේ යෙදි සිටින මහවිල,යටියන්තොට ලිපිනයේ පදිංචි අයි.අමායා දේවිනි මෙනවිය හා පී.වි කෂ්මිකා දුලාංජලී මෙනවිය පෙබරවාරි මස සිට මාස 06 ක කාලයක් පුහුණු කටයුතුවල යොදවා ගැනීමටත් රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 04/2017 අනුව දෛනිකව රු.500.00ක දීමනාවක් සහා අරමුදලින් ගෙවීමටත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.එස්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම ලෙස යෝජනාව සංශෝධනය කර ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ජයතිලක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනය මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත (ඉ) 09 යෝජනාවට අනුව ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම (ඉ) 09 යෝජනාවට අනුව ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනිමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
**(ඉ) 10.** 2022 වර්ෂයට අදාල විවිධ ණය හිමි කර්මාන්ත ණය හිමි උප ලේඛන ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| | 2022 වර්ෂයට අදාල ණය හිමි | පෙර වර්ෂයන්ට අදාල ණය හිමි | ණය හිමි මුළු එකතුව |
|---|---|---|---|
| කර්මාන්ත ණය හිමි (සභා කර්මාන්ත ) | 4,491,643.77 | 1,403,244.44 | 5,894,888.21 |
| කර්මාන්ත ණය හිමි (පළාත් සභා හා මධ්‍යම රජයයේ ප්‍රාග්ධන ආධාර ලබා දීමට අදාළ කර්මාන්ත ) | 3,313,783.73 | | 3,313,783.73 |
| විවිධ ණය හිමි | 1,106,712.85 | 286,501.09 | 1,393,213.94 |
| ගබඩා ණය හිමි | 2,581,380.50 | - | 2,581,380.50 |
| **එකතුව** | **11,493,520.85** | **1,689,745.53** | **13,183,266.38** |

ගරු මන්ත්‍රීතුමනි, ඉහත කරුණට අදාලව 2022 වර්ෂයේ දී යෝජිත කාර්යයන් ඉටු කර ගැනිමට හා ඒවායේ බිල්පත් නිරවුල් කිරිමට නොහැකි වීම නිසා වැය ප්‍රතිපාදන කිහිපයක් ණයහිමි වෙත් කිරිම් ලෙස මාස 03 ක පමණ කාලයක් රඳවා ගැනීමට නියමිතව (ඉ) 10 ට අදාල යෝජනාව ඉදිරිපත් කර ඇත.නමුත් එම යෝජනාවේ අගයන් පහත පරිදි සංශෝධනය විය යුතුය.ඒ ඒ කාර්යයන් සඳහා ලබා දි ඇති වටිනාකම් නිවැරදි වුවද එකතුව ලබා ගැනිමේ දි පමණක් දෝෂ ඇති වී තිබේ.

*. කර්මාන්ත ණය හිමි එකතුව ,රු.3,313,783.73 ලෙස ඇතුළත් අගය 3,373,783.73 ක් ලෙස ද ,

*.විවිධ ණය හිමි එකතුව රු.1,106,712.85 ලෙස ඇතුළත් අගය 1,121,712.85 ක් ලෙසද,

*.පාසල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබා දීම එක් කළ රු.2,000,000.00 සමඟ ගබඩා ණය හිමි වටිනාකම රු.2,581,380.50 ලෙස ඇතුළත් අගය රු.4,581,380.50 ක් ලෙසද, නිවැරදි කිරිම් කර යෝජනාව ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව නිවැරදි කිරිම් සහිත මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත (ඉ) 10 යෝජනාව නිවැරදි කිරිම් සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 10 යෝජනාව නිවැරදි කිරිම් සහිතව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 11. 2023 වර්ෂයේ ප්‍රාදේශිය සභා අරමුදල් යොදවා ඉටු කිරිමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘති වලට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියක් අනුමත සමිතියක් මගින් ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.මීගස්තැන්න නො 03 මාර්ගය සංවර්ධණය කිරීම. - රු.150,000.00
02.පරුස්සැල්ල ප්‍රේමරත්න මහතාගේ නිවස අසල සිට සුනිල් ශාන්ත මහතාගේ නිවස දෙසට යන පාරේ කොටසක් කොන්ක්‍රීට් කිරීම. - රු. 200,000.00
03.ගෝණගමුව මිණිගම්මන මාර්ගය අසල පැති බැම්ම ඉදි කිරීම 2 වන අදියර (සංශෝධිත) - රු.2,000.00.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 12. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.දොඹේපොල ගමට පිවිසෙන මාර්ගය මුල් කොටස සංවර්ධනය කිරීම - රු.200,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 12)**

## හදිසි යෝජනා

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 13. 2022 වර්ෂයේ ප්‍රාදේශිය සභා අරමුදල් යොදවා ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
01.ආදාහනාගාරයේ විම්ණිය කොටසක් කපරාදු කිරිම - රු.215,064.00
02.පොළ අභ්‍යන්තරය සංවර්ධනය කිරිම - රු.150,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 13)**

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**
**01 .2022 දෙසැම්බර් මාසයට අදාල වියදම් වාර්තාව**
**02. 2022 දෙසැම්බර් මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව**
**03. 2022 දෙසැම්බර් මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව**
**04. 2022 දෙසැම්බර් මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව**

**(ඌ) වෙනත් කරුණු**
**01.නොපැමිණි ගරු මන්ත්‍රිතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල හේමන්ත මැතිතුමා විදේශ ගත වීම හේතුවෙන් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පි.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා ,කීර්තිසේන අල්විස් මැතිතුමා,ටී ඉමල්කා සංජීවනි මැතිනිය අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බව දන්වා සිටිනවා.එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල හේමන්ත මැතිතුමා විදේශ ගත වීම හේතුවෙන් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පි.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා ,කීර්තිසේන අල්විස් මැතිතුමා,ටී ඉමල්කා සංජීවනි මැතිනිය අසනීප වීම නිසා අද දින සභාවට පැමිණිමට නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා.

**02.ගරු මන්ත්‍රිතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පි ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කන්දේවත්ත මාර්ගයේ අළුත්වැඩියා අවශ්‍යතාවයක් තියෙනවා. ඒ කටයුත්ත කරලා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති ඒ.වී.රෝහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, රටේ දැන් තිබෙන තත්වය අනුව අද දිනය මෙම සභාවේ අවසාන මහ සභා රැස්වීම විය යුතුයි.2001 සිට සභාව නියෝජනය කරලා විවිධ සභාපතිවරුන් සමඟ විශාල සේවාවක් අපි කළා.එම කාලය තුළ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය පැවති කාලයේ දි විශාල සේවයක් කරන්න හැකි වීම පිළිබඳ සතුටප්‍රකාශ කරනවා.නමුත් වර්තමානයේ දි රටේ ජනතාව බොහෝ අපහසුතාවයට පත්ව සිටින කාලයක් ,දේශපාලන ක්‍රියාකාරකම් නිසා සමස්ථ ජනතාවගේ අකමැත්තක් ජනතාව අතර තියෙනවා. නමුත් අපි සෑම විටම උපරිමයෙන් උත්සහ ගන්නවා ජනතාවට සේවයක් කරන්න. සභික නියෝජිත ගණන ප්‍රමාණයෙන් වැඩි කියලා වර්තමාන ජනාධිපතිතුමා ප්‍රකාශ කර සිටිනවා.එතුමාගේ නායකත්වයෙන් තමයි මන්ත්‍රී සංඛ්‍යාව වැඩි වුණේ.එම නිසා අපි සියළු දෙනා ක්‍රියාත්මක වෙන්න ඕන ගැටළු විසදාගත හැකි ආකාරයට .දේශිය දේ අභය කරන දේශිය නිශ්පාදන වැඩිවන ආනයනය අඩු කරන තීරණ වලට අපි එකතු වෙන්න ඕන.මේ සඳහා මහජනතාවට ද ආකල්පමය වෙනසක් ඇති කර ගත යුතුයි.නව නිශ්පාදන වලට ගැළපෙන ගොවියා රජ කරවන අධ්‍යාපන ක්‍රමයක් ඇති විය යුතුයි.නැතුව මේ ජනතාව පත්වෙලා ඉන්න ගැටළු විසදගන්න අමාරුයි.මම නම් පුද්ගලිකව ජනතාව සමග සිටිමින් ප්‍රාදේශිය දේශපාලනය කලා.එහි ප්‍රතිඵලයක් විදිහට හැම විටම ඉහළින්ම ජනතාව අතරින් තේරි පත් වීම සතුටට කරුණක්.නමුත් ප්‍රාදේශිය සභා පනතත් එක්ක වැඩ කළ හැකි ප්‍රමාණය වර්ධනය කරගන්න ඕන.මෙම නීතිමය කරුණු ද අදට ගැළපෙන විදිහට සංශෝධනය කරගන්න අප රටේ දේශපාලන නායත්වය මැදිහත් විය යුතුයි.

කිතුල්ගල නගරය සංචාරක ප්‍රදේශයක් ලෙස සැළකුවත් එම ප්‍රදේශයේ ගැටළු රැසක් තියෙනවා.මෙම ප්‍රදේශය ප්‍රමුඛතාවයෙන් සංවර්ධනය විය යුතුයි. පොදුවේ මෙම ප්‍රදේශවලට ලැබිලා තියෙන ප්‍රමුඛතාවය අඩුයි.අපි කොතරම් මැදිහත් වුවත් , අපි බලාපොරොත්තු වුන සේවයට අපිට ඉහළ ආයතන වලින් ලැබුණු සහයෝගය මදි.සමහර කරුණු කනගාටු දායකයි.අපි සාර්ථක තැනක ඉන්නවා .නමුත් අපි තවත් සාර්ථක විය යුතුයි.විශේෂ ජයග්‍රහණ ලැබිලා තියෙනවා.මේ සඳහා පෙර අවස්ථා වල නොතිබුණු පරිදි කාර්යය මණ්ඩලයේ සහයෝගය ලැබිලා තියෙනවා.ලේකම්තුමා දක්වන සහයෝගය ඉතාම ඉහළයි.ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත විය යුතුයි.සියළු දක්ෂතා එක්කරගෙන ඉදිරියේ දි මෙම සභාව සාර්ථක ගමනක් යයි කියලා මම විශ්වාස කරනවා. ඒ සඳහා සැමට සුභ පතනවා.

ගරු සභාපතිතුමා බොහොම නිහතමානී නායකයෙක් ඔබතුමා නැවත වතාවක් සභාපති විය යුතුයි කියලා මා හිතනවා.නමුත් අපි දක්ෂතා වලට අවධානය දීලා තවත් සාර්ථක ගමනක් යා යුතුයි.ඒ සඳහා සභාවේ නායකත්වය ගත යුතුයි.මේ කාළය තුළ ප්‍රාදේශිය සභාවට උදව් කළ සැමටත්, නායකයින්ටත් මාගේ ගෞරවය පුද කර සිටිනවා..

පසුගිය කාලය තුළ මෙම සභාව තුළ මතුවුණු විවිධ කරුණු වලදි මා විවිධ අදහස් දරලා තියෙනවා .නමුත් ඒ කිසිම කෙනෙක් සමඟ අමනාපයෙන් නෙවෙයි. එහෙම වුණේ වඩා හොඳ මතය ස්මතු කරන්න. ඒ සඳහා මාගේ කිසිම අමනාපයක් නෑ.පසුගිය කාලය තුළ මා අතින් යම් වරදක් හිත් රිදවීමක් වූවානම් මා කනගාටුව ප්‍රකාශ කරනවා.ඔබ සුමට සුභ අනාගතයක්.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පළාත් පාලන සභික නියෝජිතයින් ප්‍රමාණය වැඩි කිරිමට පක්ෂ විපක්ෂ සියළුම දෙනා විවිධ දායකත්වය ලබා දීලා තියෙනවා.එසේම රට දැන් යම් ගැටළුවකට පත් වෙලා තියෙනවා.1977 විවෘත ආර්ථිකය ප්‍රභල බලපෑමක් ඇති කළා.නමුත් ඉන්පසු පත් වුණු සියළු රජයන් විවෘත ආර්ථිකයට පිළියම් යෙදුවේ නෑ.ඒක අඩුපාඩුවක් ලෙස මම දකිනවා.ගැටළුව ගැන නිතර කථා කරත්,ගැටළුවට හේතුව හොයලා විසඳුම් දෙන්න සාර්ථක නායකයින් හිටියේ නැති වීම ගැටළුවක්.නමුත් වෙනත් මතයක හිටිය වර්තමාන ජනාධිපතිතුමා වර්තමානයේ හොඳ ප්‍රතිරූපයක් ලබාගෙන තියෙනවා.එය හොඳ තත්වයක්.ජාතික ආණ්ඩුව හොඳ වැඩසටහනක් .ඒ සඳහා අපි සැවොම එක්ව කටයුතු කළ යුතුයි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපි සහ අන් රටවල් ලොකු ගැටළුවකට මුහුණ දීලා තියෙනවා.නමුත් එම ගැටළුවට විසඳුමක් ලෙස දැනුත් අපි ක්‍රියාත්මක කරන්නේ අධිරාජ්‍යවාදීන්ගේ න්‍යාය පත්‍රයක්.එම නිසා මෙම ක්‍රමයට මම නම් එකඟ නෑ.අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය විදිහට රට වෙනස් වෙනවට මම අකමැතියි.දැන් රට පවතින තත්වය අනුව ජනතාවට වැඩි සහනයක් සැපයිය යුතුයි.නමුත් පවතින ක්‍රමය තුළ වර්ධනයක් දකින්න නොමැති වීම කනගාටුවක්.මෙම ප්‍රාදේශීය සභාව තුළ සහෝදරත්වයෙන් ජනතාවට හැකි උපරිම සේවයක් කළා කියලා මා විශ්වාස කරනවා.දේශපාලන නායකත්වය බෙදීමකට ලක් කරලා විසඳන්න හැදුවට අපි සාර්ථක ධූර කාළයක් අවසන් කරමින් ඉන්නවා කියලා මම විශ්වාස කරනවා.ඒ සඳහා සැමට සුභ පතනවා සියළුම දෙනාට ජයග්‍රාහි කාළයක් උදා වේවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙම ධූර කාළය තුළ සැම විටම අපි සභාපතිතුමාට සහය දුන්නා.ධූරකාලය අවසන් කාලයේ දි සභාවට ලැබුණු ලේකම්වරයා සභාවට මෙන්ම කාර්යය මණ්ඩලයට විශාල ශක්තියක් වුණා.එම නිසා ඉදිරි ධූරකාලය තුලත් මෙම ලේකම්වරයා යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් කටයුතු කිරිමට අවශ්‍ය බව දන්වනවා.

ඒ වගේම මෙම කාලය තුල ගරු සුජිත් සංජය පෙරේරා මැතිතුමා අපට ලබා දුන්න මග පෙන්වීම අගය කරනවා.පසුගිය කාලයේ අපි මුහුණ දුන්න වැරදි දේශපාලන තීන්දු නිසා ජනතාව ගැටළුවකට මුහුණ දීලා තියෙනවා.ඉන්ධන හා කාබනික පොහොර ගැටළුව ජනතාවට ගැටළුවක් ඇති කරා.එය එසේ නොවිය යුතු දෙයක් සභාව හා ජනතාව අපෙන් බලාපොරොත්තු වුන බොහෝ දේවල් ඉටු කර ගත්තා.එසේ කරගන්න බැරි වුනානම් ඒ අපේ දෝෂයක් විය හැකියි.අපි අඩුපාඩු දෝෂ මග හැරගෙන කටයුතු කළ යුතුයි.ඒ සඳහා ඉදිරි ධූර කාලය ජයග්‍රණය කරන්න හැම දෙනාටම ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මගේ දේශපාලනය ජීවිතයේ බලාපොරොත්තු වූ ජනතා සේවය 90% ක් පමණ ඉටු වූ ස්වර්ණමය වසර 05 ක් ලෙස මෙම ධූර කාලය හඳුන්වන්න පුළුවන්.ඊට මට සහය වුනේ ගරු මනෝගනේෂන් ඇමතිතුමා, සුජිත් සංජය පෙරේරා මැතිතුමා සහ ගරු සභාපති ලෙස ඔබතුමා ඒ පිළිබඳ මම සතුටු වෙනවා.ගෞරවය ලබා දෙනවා.විශේෂයෙන්ම පනාවත්ත නො.01 ජල ව්‍යාපෘතිය ලබා ගැනිම පිළිබඳ සතුටුයි.මීගස්තැන්න මාර්ගය සංවර්ධනය කරලා ජනතාවට පහසුකම් ලබා දෙන්න පසුගිය කාලයේ අපට පුළුවන් වුණා.ඒ සඳහා කටයුතු කරලා දෙන්න නායකත්වය දුන්නු ගරු සුජිත් සංජය පෙරේරා මැතිතුමාට අපි ගෞරව කරනවා.ඒ වාගේම වතු ජනතාවගේ බොහෝ මාර්ග වලට වීදී ලාම්පු ලබා දීලා ඉතා ඉහළ සේවයක් කරලා දෙන්නත්,පනාවත්ත ප්‍රදේශයේ ජල ප්‍රශ්ණයට ඉඩෝර කාළයේ දි ජල බවුසර් මගින් ජලය ලබා දෙන්නත් ,කොවිට් වලදි වතු ජනතාවට සේවය කරන්නත් මේ සභාවෙන් මට පුළුවන් වුණා. මේ සඳහා සහයෝගය දැකු වූ ගරු සභාපතිතුමාටත්.ලේකම්තුමාටත්,කාර්යය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා.මේ ජයග්‍රහණ වලට අවස්ථාව ලබා දුන් ඔබ සියළු දෙනාටම ස්තුත්වන්ත වෙනවා.සුභ පතනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මන්ත්‍රිවරු ලෙස අපිට හොඳ මඟපෙන්වීමක් ගරු සභාපතිතුමාගෙන් ලැබුණා.ජනතාවට ආදායම් මාර්ග දියුණු කරගන්න,ඝණ අපද්‍රව්‍ය හා නගර පිරිසිදු කිරිම ,පරිසර සංරක්ෂණය සඳහා සභාපතිතුමා හා ලේකම්තුමා ලබා දුන්න මග පෙන්වීම ඉතාම විශිෂ්ඨයි කියලා මම හිතනවා.ඒ වගේම කාර්යය මණ්ඩලයේ ලොකු දායකත්වයක් ලබා දුන්නා.අපි විශාල ජනතා සේවයක් කරන්න අපේක්ෂා කරත් සභාවේ අරමුදල සැළකීමේ දී විශාල ලෙස මුදල් වියදම් කරන්න සභාවට බැහැ.නමුත් අපි හැකි උපරිමයෙන් සහෝදරත්වයෙන් ඉටු කළා. යටියන්තොට ජල යෝජනා ක්‍රමය ලබා ගැනිමට ගරු සභාපතිතුමා සහ සුජිත් සංජය පෙරේරා මැතිතුමා ලබා දුන් සහයෝගයට බොහොම ස්තුතියි.ඉදිරි වර්ෂය සියළුම දෙනාට ජයග්‍රාහි සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපි සහෝදරත්වයෙන් කටයුතු කරලා ජයග්‍රාහන රැසක් ලබා ගත්තු ධූර කාලයක් තමයි . මේ කුමන හෝ කරුණක දි හෝ යම් අඩුපාඩුවක් වුවානම් ඔබතුමාගෙන් සමාව අය ද සිටිනවා.සියළුම දෙනාට ජයග්‍රාහි කාලයක් උදා වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩයනා පාලමකුඹුර මැතිනිය**

**ගරු සභාපතිතුමනි, තරුණ සභික නියෝජිතවරියක් ලෙස මෙම ආයතනයේ කටයුතු කළා.මගේ ජීවිතේට අත්දැකීම් ලබා ගෙන,ජනතාවට සේවය කිරිමට මට හැකි වුණා.ඒ සඳහා මට අවස්ථාව ලබා දුන් ගරු සුජිත් සංජය පෙරේරා මැතිතුමාට ,ගරු සභාපතිතුමාට හා ජාතික තරුණ සේවා සභාවට මාගේ**

**ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා.ඒ වගේම ලේකම්තුමා හා කාර්යය මණ්ඩලය විශාල සහයෝගයක් ලබා දුන්නා.ලේකම්තුමා රාජකාරි ඉටු කරන විදිහ ඉතාම විශිෂ්ඨයි. වෙනත් ප්‍රාදේශීය සභා ගැටුම් එක්ක තමයි ඉදිරියට යන්නේ අපි සහෝදරත්වයෙන් සාර්ථකත්වයෙන් ගමනක් ආවා.අපි විවේචන අත්හැරලා අවංක සේවයක් කරන්න ඉදිරි ධූරකාලය යොදා ගනිමු. මහජන සේවයට කැප වී ප්‍රදේශය දියුණු කරන්න ඔබ සැමට ජයග්‍රහණය ප්‍රාර්ථනා කරනවා. ලේකම්තුමාගේ සේවය නව ධූර කාලයේත් යටියන්තොටට ලබා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා. මේ සහෝදර එකමුතුව සභාවට ලොකු ශක්තියක් සැමට සුභ පතනවා.බොහෝම ස්තුතියි.**

**ගරු ප්‍රාදේශිය සභා  මන්ත්‍රී ඩබ්ලිව්. කතිකා දමයන්ති මැතිනිය**

**ගරු සභාපතිතුමනි, දීර්ඝ කාලයක් දුෂ්කර ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් විශාල සේවයක් සිදු කරන්න මට පුළුවන් වුණා කියලා මට සතුටු වෙන්න පුළුවන්.ඒ ගමනේ දි විශාල සහයෝගයක් ලබා දුන්න ශ්‍රී ලාල් වික්‍රමසිංහ මැතිතුමාටත්,ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාටත් විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම ජනතාව දීර්ඝකාලයක් ලබා දුන් සහයෝගයට ජනතාවට මාගේ ගෞරවය පුද කර සිටිනවා. ඒ වගේම ගරු ලේකම්තුමාටත් කාර්යය මණ්ඩලයටත් ස්තුතිය පුද කර සිටිනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් ප්‍රේමසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඉහළ වටගල සහ මම නියෝජනය කරන ප්‍රදේශය දුෂ්කර ප්‍රදේශයක් .මෙම ප්‍රදේශයට විදුලිය ලබා ගන්න ,මාර්ග සංවර්ධනය කරන්න අපිට හැකි වුණා.ඊට අවශ්‍ය කටයුතු සලසා දීලා මට දේශපාලන නායකත්වය ලබා දුන්නා ගරු ශ්‍රී ලාල් වික්‍රමසිංහ මැතිතුමාට මාගේ ස්තුතිය පුද කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.ආර්ථික අපහසුතා කෙතරම් තිබුණත් මම දේශපාලන ප්‍රතිපත්තිය වෙනස් කරන්නේ නෑ.නමුත් දේශපාලන කටයුතු වලට කාලය ගත කිරීම දැන් අපහසුයි.

සහෝදරත්වයෙන් සභාවේ කටයුතු කළ ඔබතුමාටත් ,ලේකම්තුමා හා කාර්යය මණ්ඩලයටත් ලබා දුන් සහයෝගයට ස්තුතිය පුද කර සිටිනවා. ගරු මන්ත්‍රීතුමන්ලා සියළුම දෙනාට සුභ පතනවා.අඩුපාඩුවක් වුනානම් සමාව අයද සිටිනවා.මම ක්‍රියාකාරි දේශපාලනයේ හිටියත් නැතත් මාගේ ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස කාරුණිකව මම ඉල්ලා සිටිනවා.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**

**ගරු මන්ත්‍රීතුමනි ප්‍රබල බහුතරයක් නොතිබුණු මෙම සභාව තුල කුසපත් ඇදීමෙන් තමයි මම සභාපති වුනේ.වසර 05 ක් බොහෝ අවස්ථා වලදී බෙදීමක් නොමැතිව සියලු දෙනා එක මතයක ඉඳලා ධූර කාලය ක්‍රියාත්මක කරන්න ලැබීම ජයග්‍රහණයක්.එහි පදනම සහෝදරත්වය කියලා දන්වන්න ඕන.ඒ සඳහා ඔබ හැම ලබා දුන් සහයෝගයට ස්තුතියි.**

**ලේකම්තුමාගේ කාර්යය ද අපිට විශාල සහයෝගයක් ලබා දුන්නා.ඉතාම සාර්ථක කාර්යය මණ්ඩලයක් හා යමින් මෙහයවමින් එතුමා සතුටුදායක සහයෝගයක් ලබා දුන්නා.ඒ සඳහා එතුමාටත් කාර්යය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා.**

**ප්‍රාදේශීය සභාවක සභාපති කටයුතු කළ යුත්තේ සභාවේ නෛනතික සීමාව තුළය.සභාවක සභාපති වුණා කියලා හැමදේම ඉටු කරන්න බෑ.එම සීමාවෙන් එහා කටයුතු කිරීමෙන් අනාගතයට ප්‍රශ්ණ එකතු වෙනවා.නමුත් මම ඔබත් කාර්යය මණ්ඩලයත් සමග ඉතා සතුටුදායක ධූරකාලයක් අවසන් කරමින් සිටිනවා.මේ සැමට සහය වූ ඔබට බොහොම ස්තුතියි.තවදුරටත් යටියන්තොට ජනතාව වෙනුවෙන් වැඩි සේවයක් ඉටු කරන්න සැමට ශක්තිය පතනවා.**

අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් ප.ව 2.15 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි